**දකුණු පළාත් සභාව - 2015**

----------------------------

දකුණු පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

----------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දකුණු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත්, දකුණු පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙනඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2016 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. 2014 දෙසැම්බර් 31 දිනට රු.742,171,657 ක් වූ පළාත් සභා සමුච්චිත අරමුදලේ ශේෂය 2015 දෙසැම්බර් 31 දිනට රු.2,765,001,880 ක් දක්වා රු.2,022,830,223 කින් වර්ධනයවී තිබුණි.

2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාළව 2016 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත්කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 25 | 22 | 03 |
| (ii) | ආදායම් ගිණුම් | 25 | 20 | 05 |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 91 | 76 | 15 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 11 | 06 | 05 |
| (v) | අරමුදල් ගිණුම් | 07 | 05 | 02 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 01 | 04 |
| (vii) | විශේෂ අත්තිකාරම් ගිණුම් | 01 | - | 01 |
| | එකතුව | 165 | 130 | 35 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව අරමුදල් ගිණුම පිළියෙල කර ඇති බව දක්වා තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.692,504,844 ක් වූ හිඟ ආදායම ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම් ගතකර නොතිබුණු අතර, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ලෙස වාර්තා නොවූ නොවැම්බර් හා දෙසැම්බර් යන මාස දෙකට අදාළව 2016 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මස ලැබී තිබුණු රු.57,482,884 ක වාහන ලියාපදිංචි කිරීමේ ආදායම් පළාත් සභා ආදායම යටතේ ගිණුම් ගතකර නොමැති නිසා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව උපචිත පදනම අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) කල්බදු පහසුකම් යටතේ මිලදීගෙන තිබූ වාහන 100 හි වාරික වෙනුවෙන් රු.102,093,420 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. කෙසේ වුවද, මෝටර් වාහනවල වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර, තවදුරටත් ගෙවිය යුතු රු.199,159,592 ක් වූ වාරික මුදලද වගකීම් යටතේ දක්වා නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සඳහා අනුගමනය කරන ලද පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් හෙළිදරව් කර නොතිබුණි. පළාත් සභාව ආරම්භයේ සිට මධ්‍යම රජය විසින් හා පළාත් සභාව විසින් සැලකිය යුතු වියදමක් දරා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු.78,583,111 ක වියදම් දරා තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට විසර්ජන ගිණුම්වල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තා අනුව එකතුව රු.1,599,436,856 ක් වූ ස්ථාවර වත්කම් ශේෂ පෙන්නුම් කළද, අරමුදල් ගිණුමේ මේ පිළිබඳව සඳහන් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විසර්ජන ගිණුම් යටතේ දක්වා තිබුණු එකතුව රු.106,436,440 ක් වූ බැරකම් වියදම් යටතේ මෙන්ම උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු ලිපිද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය තොගවලින් වර්ෂය අවසානයට වූ ඉතිරි තොගය ගණන් බලා එම වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ දැක්වීමට පියවර ගෙන නොතිබුණි. දරන ලද සම්පූර්ණ වියදම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,818,667 ක් වූ ස්ථාවර තැන්පත් පොලිය, ආදායම් විෂයයක් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ආයෝජන පොලී ආදායම රු.87,148 ක් හා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.23,642 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) මාර්ගස්ථ මුදල්

-----------------

(i) පළාත් සභා අරමුදල් ගිණුමෙ 2015 දෙසැම්බර් 31 දිනට රු.58,601,102 ක් වූ මාර්ගස්ථ මුදල් ශේෂය හා එදිනට වැඩිපුර ලැබී තිබුණු රු.13,769,149 ක මුදල මූල්ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් යටතේ වෙන් වෙන්ව නොදක්වා, එම ශේෂ එකිනෙක හිලව් කර රු.44,831,953 ක් වූ ශුද්ධ වෙනස වෙනත් මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ආදායමට වඩා වැඩිපුර ලැබීම් ලෙස දක්වා තිබුණු රු.13,769,149 ක මුදල සකස් වූ ආකාරය මෙන්ම මෙලෙස වැඩිපුර පියවීමක් සිදු වූයේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් 03 ක් යටතේ දක්වා තිබුණු රු.56,358,512 ක මාර්ගස්ථ මුදල් 2016 අප්‍රේල් 30 වන විටත් ලැබී නොතිබුණි. ඒ අනුව මෙම අගයන් මාර්ගස්ථ මුදල් නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.286,134 ක මුදල අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා ආපසු යවා තිබියදීත්, නැවත වෙනත් ප්‍රදාන ලැබීම් යටතේ හා රාජ්‍ය ආයෝජන යටතේ දක්වා තිබුණි. මේ හේතුව නිසා එකී ගිණුම් දෙකෙහි වටිනාකම සමාන අගයෙන් වැඩියෙන් දැක්විණි.

2.2.5 නොසැසඳූ පාලන ගිණුම්

-------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,818,968,388 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන සහ වාර්තාවල දැක්වෙන ශේෂ අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.35,333,970 ක් විය.

2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අන්තර් කලාප ණයගැති ශේෂ එකතුව රු.26,673,492 ක් සහ ණයහිමි ශේෂ එකතුව රු.5,211,813 ක් වූයෙන් අන්තර් කලාප ණයගැති හා ණයහිමි ශේෂ අතර රු.21,461,679 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගාල්ල කලාපයේ පොදු තැන්පත් කේවල ශේෂ ලැයිස්තුවේ එකතුව රු.1,636,089 ක් වුවද, ගිණුම අනුව එම ශේෂය රු.28,276,994 ක් වූයෙන් ශේෂ අතර රු.26,640,905 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.7 අවිනිශ්චිත ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ රු.33,513 ක හර ශේෂයක් පැවතියද, ඊට බලපාන ලද වෙනස්කම් හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම් යටතේ දක්ෂිණ සංවර්ධන අධිකාරියට ලබාදී තිබුණු රු.5,614,080 ක ණය ශේෂය වසර ගණනාවක සිට අයවීම් රහිතව දිගින් දිගටම නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින නමුත් , එම ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ආ) පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

-----------------------------------------------

මූල්‍ය වත්කම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ වූ රු.785,991,308 ක ශේෂයට පහත විස්තර දැක්වෙන පරිදි නිලධාරීන් 6518 දෙනෙකු ගෙන් අයවිය යුතු එකතුව රු.102,394,948 ක් වූ ණය ශේෂ ඇතුළත්වී තිබුණි.

| විස්තරය | නිලධාරීන් සංඛ්‍යාව | අයවීම් හිඟ හිටි ණය ශේෂ |
|---|---|---|
| | | රු. |
| ස්ථාන මාරු වී ගිය | 5,765 | 88,621,561 |
| විශ්‍රාම ගිය හා මියගිය | 387 | 9,115,789 |
| වැඩ තහනම් කළ | 201 | 3,195,106 |
| සේවය හැර ගිය | 165 | 1,462,492 |
| | 6,518 | 102,394,948 |

(ඇ) දකුණු පළාතේ ආයතන මෙන්ම වෙනත් පළාත් සභා හා මධ්‍යම රජයේ ආයතන වලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 3434 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.55,400,119 ක ණය ශේෂ නිරවුල් නොවී පැවතුණි.

(ඈ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මගින් සම්ප්‍රදායික ඖෂධීය පැරණි වී වර්ග ප්‍රචලිත කිරීමේ වැඩ සටහන යටතේ හෝමාගම හා හම්බන්තොට ගොවි සංවිධාන දෙකකට 2008 හා 2013 වර්ෂ වලදී ලබාදී තිබුණු ණය මුදලින් රු.2,028,939 ක් හා රු.205,883 ක හිඟ පොලී මුදලක් 2016 අගෝස්තු 31 දින වන විටත් අයවිය යුතුව පැවතුණි.

(ඉ) 2011 නොවැම්බර් සිට 2012 පෙබරවාරි දක්වා කාලය තුළ යතුරු පැදි ණය ලබාගත් පළාත් පාලන ආයතන සභිකයින් 14 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.427,200 ක මුදලක් අයවිය යුතුව තිබුණි. මින් රු.412,390 ක් සභික ධුරය අතහැර ගිය හා මියගිය සභිකයින් 10 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ විය.

2.2.9 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පහත විස්තර දැක්වෙන එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

| | ගිණුම් විස්තරය | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගය | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| 1. | ඉඩම් හා ගොඩනැගිලි | 81,258,071 | හිමිකම් ඔප්පු, අයිතිය තහවුරු කෙරෙන ලියවිලි |
| 2. | වෙනත් ආදායම් | 22,400,000 | ගණනය කරන ලද ආකාරය දැක්වෙන උප ලේඛන. |
| 3. | ව්‍යාපෘති ණයහිමියෝ | 20,000,000 | ලිපිගොනු, ලේඛන හා ශේෂ තහවුරු කිරීම. |
| 4. | ව්‍යාපෘති ආදායම් | 1,877,814,443 | 2011 සිට 2015 දක්වා ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ප්‍රකාශන. |

2.2.10 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | මුදල | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 2014 අංක 8 හා 2015 අංක 9 දරන (සංශෝධන) පනත් මගින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2013 සැප්තැම්බර් 01 දිනැති අංක sec/2013/07 දරන දේශීය ආදායම් චක්‍රලේඛය | 383,589 | පහත විස්තර දැක්වෙන ආයතන විසින් පනතේ විධිවිධාන ප්‍රකාර උපයන විට ගෙවීම් බදු අයකර නොතිබුණි.<br><br>(i) දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් 4 දෙනෙකුගෙන් සහ සේවා නියුක්තිකයන් නොවන පුද්ගලයින් 4 දෙනෙකුගෙන් අඩුවෙන් බදු අයකර ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | | (ii) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය , |
| | | - | ➢ නිලධාරීන් 3 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ මාස 4 ක් සඳහා පමණක් බදු අඩු කර තිබුණි. |
| | | 38,400 | ➢ සියයට 10 ක බදු මුදල අඩු කර නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවා තිබුණි. |
| | | - | ➢ බදු චක්‍ර අංක 7 ට අනුව බදු අඩු කළ යුතු සභාපති දීමනාව සඳහා බදු චක්‍ර අංක 1 යටතේ සමාලෝචිත වර්ෂයේ මාස 8 ක් සඳහා බදු අඩු කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------- | | |
| | (i) මුදල් රෙගුලාසි 571(2) | 47,927,592 | තැන්පත් කර අවුරුදු 2 කට වැඩි කාලයක් ඉක්මවූ, ආයතන 10 කට අදාළ කල් ඉකුත්වූ තැන්පතු ශේෂ 621 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 1646 | - | අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන 12 ක් සඳහා 2015 වර්ෂයේ දෛනික ධාවන සටහන්පත් සහ මාසික සාරාංශ 116 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | පළාත් මුල්‍ය රීති<br>------------------ | | |
| | (i) 54.1 රීතිය | 161,872 | දකුණු පළාත් සංවර්ධන අධිකාරියට අයත් කැබ් රථයක් අවස්ථා දෙකකදී හදිසි අනතුරුවලට භාජනය වීමෙන් සිදුවී තිබුණු අලාභ සම්බන්ධව පොලීසිය වෙත වාර්තා කර නොතිබුණි. |
| | (ii) 54.5 හා 54.6 රීති | - | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ වාහනයකට සිදුවූ අනතුරු 02 ක් සම්බන්ධයෙන් සහ පළාත් කෘෂිකර්ම ... අමාත්‍යාංශය සතු වාහන 05 කට සිදු වී තිබූ අනතුරු 05 ක් සම්බන්ධයෙන් යොමුගත මූල්‍ය රීති අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) 59 රීතිය | - | දකුණු පළාත් අධ්‍යාපන ...අමාත්‍යාංශය සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හානි හා පාඩු ලේඛන පවත්වා නොතිබුණි. |
| (iv) 118 රීතිය | 7,807,393 | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමට තැන්පත් නොකරන ලද තැන්පතු ශේෂ 38 ක් නිරීක්ෂණය විය. |
| (v) 259.2 රීතිය | - | මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු.253,590,031 ක නොපිය වූ අග්‍රිම ගිණුම් ශේෂයෙන් ආයතන 02 කට අදාළ එකතුව රු.89,159,032 ක් වූ ශේෂ 2016 ජුනි 30 දින වන විටත් පියවා නොමැති බව නිරීක්ෂණය විය. |
| (vi) 261.2.2 රීතිය | - | ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන ලබුදූව ගොවිපල පුහුණු කළමනාකරු වෙත ප්‍රදර්ශනයක් සඳහා 2015 ජුලි 27 දින රු.183,000 ක අතුරු අග්‍රිමයක් නිකුත් කර තිබුණි. |
| (vii) 270.1 රීතිය | 387,388 | දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2015 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් තැන්පතු ශේෂ 61 ක් පැවති බව නිරීක්ෂණය විය. |
| (viii) 283.4 රීතිය | 3,494,438 | ආයතන 4 ක් විසින් නිකුත් කර තිබුණු නමුත්, ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06ක කාලයක් ඉක්මවූ චෙක්පත් 159 ක් සම්බන්ධයෙන් යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ix) රීති 560 හා 561 යන රීති සහ 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | දකුණු පළාත් අධ්‍යාපන ...අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මෙන්ම දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |

(ඈ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | - | දකුණු පළාත් අධ්‍යාපන ...අමාත්‍යාංශය,පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මෙන්ම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිගණක, උපාංග හා මෘදුකාංග වෙනුවෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක 437 හා 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ. | - | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අයත් වාහන 4 ක් හා බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරයට අයත් වාහන 2 කට අදාළ රක්ෂණ ආවරණ අලෙවි නියෝජිතයෙකු මාර්ගයෙන් ලබාගෙන තිබුණි. |
| (ඊ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | - | සෑම මාස 06 ට වරක්ම රජයේ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, පළාත් ආයතන හයකට අයත් වාහන 115 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | (ii) 2004 දෙසැම්බර් 27 දිනැති හා අංක 22/99(iv) – 2004 දරන චක්‍රලේඛය | - | 2015 මැයි මාසයේ සිට 2016 අගෝස්තු දක්වා රු.350 ක මාසික ගාස්තුව නොගෙවා සමුපකාර කොමසාරිස්වරයා විසින් නිල රථය පෞද්ගලික ගමන් සඳහා යොදාගෙන තිබුණි. |
| | (iii) 1985 මැයි 10 දිනැති අංක 289 දරන හා 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛ සහ 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛ ලිපිය | - | දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් සංචිත වාහන 09 ක රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කර නොමැති බව නිරීක්ෂණය විය. |
| (උ) | අංක 93/5 හා 1974 ජනවාරි 10 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද සමුපකාර රීති මාලාවේ 43(1) රීතිය | - | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා රු.2,141,543 ක ස්ථාවර වත්කම් හා රු.47,000 ක ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට මෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු හා අධ්‍යාපන කටයුතු සඳහා රු.434,303 ක් සමුපකාර අරමුදලින් වැයකර තිබුණි. |

### 2.2.11 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 09 කට අදාළ සීමා ඉක්මවීම් අවස්ථා 12 ක්ද, ගිණුම් 07 කට අදාළ සීමා කරා ලඟානොවීම් අවස්ථා 07 ක්ද, නිරීක්ෂණය විය.

(ආ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.1,465,460 කට මිලදීගෙන තිබුණු පරිගණක හා උපාංගවල සහ මුද්‍රණ යන්ත්‍රවල වටිනාකම අදාළ වැය විෂයයට ගිණුම්ගත කළේ නම් එම වැය විෂයයේ ඇස්තමේන්තු සීමාව රු.1,342,786 කින් ඉක්මවායාම වළක්වා ගැනීමේ අරමුණින් ප්‍රතිපාදන ඉතිරිවූ වැය විෂයයක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 12 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මවීම නිසා දෙසැම්බර් මස වියදම්, එම වැය විෂයයන්ට අධිභාර කර වෙනත් වැය විෂයයන් 08 කට එකතු කර තිබුණි. මෙකී වියදම් නිවැරදි වැය විෂයයන්ට ගිණුම්ගත කළේ නම් එකතුව රු.54,734,861 ක වියදම් අතිරික්තයක් උද්ගතවන බව නිරීක්ෂණය විය.

(ඈ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මා වියදම් දැරීම හේතුවෙන් ඇති වී තිබුණු රු.12,655,201 ක් වූ අධිවැය වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඉ) (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනියම් පදනම මත බඳවාගෙන විෂයභාර අමාත්‍යවරයා වෙත අනුයුක්ත කර තිබුණු සේවකයින් 14 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,911,986 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ii) 2010 දෙසැම්බර් මස සිට 2014 ජුනි මස දක්වා කාලය තුළ අධිකාරියේ ස්ථිර රියදුරන් 05 දෙනෙකු විෂයභාර අමාත්‍යාවරයාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර තිබුණු අතර, 2016 ජුනි මස දක්වා අධිකාරිය විසින් ඔවුන් වෙත එකතුව රු.4,095,465 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඊ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2015 ජූලි 03 දිනැති අංක 05/2015 දරන චක්‍රලේඛය ප්‍රකාර වෙළඳපොල මිල සඳහුම් ක්‍රමය යටතේ වූ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරී සීමාව රු.500,000ක් වියයුතුය. ඇස්තමේන්තු මුදල රු.2,100,000 ක් වූ දංදෙනිය උප කාර්යාලය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් අධිකාරී සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි.

(උ) 2014 සහ 2015 යන වර්ෂ සඳහා පත්කර තිබුණු භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඔවුන් වෙත පවරා තිබූ අධිකාරි බලය ඉක්මවා පහත දැක්වෙන පරිදි කටයුතු කර තිබුණි.

- ලබුදූව ගොවිපල සතු රු.9,077,424 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි රු.445,500,000 කට අගය කර වත්කම්වල වටිනාකම රු.436,422,576 ක් හෙවත් සියයට 4808 කින් වැඩි කර තිබුණි.

- පෝද්දිවෙල ගොවිපල සතු රු.2,500,000 ක් වූ ඉඩමෙහි වටිනාකම රු.20,000,000 ක් දක්වා රු.17,500,000 ක් හෙවත් සියයට 700 කින් වැඩි කර තිබුණි.

- තෙලිජ්ජවිල ගොවිපල සතු රු.3,567,500 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.300,280,952 ක් දක්වා, රු.296,713,452 ක් හෙවත් සියයට 8317 කින් වැඩි කර දක්වා තිබුණි.

(ඍ) අංක 30 දරන 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සේවක වැටුප් වැඩි කර තිබුණු අතර, වැඩිපුර ගෙවා ඇති වැටුප් වලට අදාළ ගැලපීම් කර වැටුප් නිවැරදි කර නොතිබුණි. එසේ තිබියදී 2006 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නිලධාරීන් 71 දෙනෙකු විශ්‍රාම ගැන්වීමට මෙන්ම සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

3. ආදායම් කළමනාකරණය

-----------------------------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බදු ආදායම සහ බදු නොවන ආදායම පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| ආදායම් වර්ගය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2011<br>රු.මිලියන | 2012<br>රු.මිලියන | 2013<br>රු.මිලියන | 2014<br>රු.මිලියන | 2015<br>රු.මිලියන |
| බදු ආදායම | 3,705 | 3,890 | 4,039 | 4,864 | 5,654 |
| බදු නොවන ආදායම | 570 | 619 | 717 | 546 | 650 |
| එකතුව | 4,275 | 4,509 | 4,756 | 5,410 | 6,304 |

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ මුද්දර ගාස්තු, ඖෂධ හා රසායන බදු, බණිජ බදු සහ පිරිවැටුම් බදු ආදායම, පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| ආදායම් විස්තරය | 2015.01.01 දිනට ශේෂය | වර්ෂයේ තක්සේරුව | වර්ෂය තුළ අයකිරීම් | වර්ෂය තුළ නිදහස් කිරීම් | 2015.12.31 දිනට ශේෂය | අයකිරීමේ ප්‍රතිශතය | නිදහස් කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | | |
| මුද්දර ගාස්තු | 500,009,779 | 673,076,785 | 110,502,556 | 405,480,297 | 657,103,711 | 9.42 | 34.56 |
| ඖෂධ හා රසායන බදු | 1,780,940 | 1,383,046 | 669,365 | 282,750 | 2,211,871 | 21.15 | 8.93 |
| බණිජ බදු | 11,785,475 | 4,086,560 | 4,973,774 | 980,593 | 9,917,668 | 31.33 | 6.17 |
| පිරිවැටුම් බදු | 55,364,524 | - | 2,101,716 | 6,029,911 | 47,232,897 | 3.79 | 10.89 |
| එකතුව | 568,940,718 | 678,546,391 | 118,247,411 | 412,773,551 | 716,466,147 | 9.47 | 3.30 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) ඉහත දැක්වෙන තොරතුරු අනුව හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවති බව සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ රු.568,940,718 ක හිඟ බදු ආදායම වර්ෂය අවසානයට රු.716,466,147 ක් දක්වා වර්ධනය වීමෙන් තහවුරු කෙරිණි.

(ii) ආදායම් විෂයයන් දෙකකට අදාළව වර්ෂය තුළ අයකළ බදු ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයක බදු නිදහස් කර තිබුණි.

(ආ) බෙන්තොට ජනකලා කේන්ද්‍ර භූමියේ බදු දුන් ගොඩනැගිලි 03 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු මුදල්වල එකතුව රු.286,200 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි.

(ඇ) බදු අයකර ගැනීම්

--------------------

(i) රජයේ ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාළ බදුකරුවන් 22 දෙනෙකුගෙන් හා තංගල්ල හා තිස්සමහාරාම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකට අදාළ බදුකරුවන් 13 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.2,487,257 ක හා රු.7,566,776 ක දීර්ඝ කාලීන බදු හා දඩ මුදල් අයවිය යුතුව තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක වාර්ෂික අවසර පත්‍ර ලාභීන් 466 දෙනෙකුගෙන් රු.905,831 ක හිඟ බදු හා දඩ මුදල් අයවිය යුතුව තිබුණි.

(ඈ) සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම්

-------------------------------

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 05 කට අයත් බලපත්‍රධාරීන් 27 දෙනෙකුට හා තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආයතන 02 කට ලබාදී තිබූ සුරාබදු බලපත්‍ර 41 ක් වෙනුවෙන් අයවිය යුතුව තිබුණු පිළිවෙලින් එකතුව රු.12,136,250 ක හා රු.253,334 ක සංශෝධිත බලපත්‍ර ගාස්තු, ප්‍රමාද ගාස්තු හා සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු නොගෙවා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

(ඉ) (i) 1994 අංක 02 දරන දකුණු පළාත් සභාවේ මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ v වන පරිච්ඡේදයේ 10 වගන්තිය මගින් පඩි හා මිම් ආඥා පනත යටතේ අයකරනු ලබන ගාස්තු පළාත් ආදායම් කොමසාරිස් වරයාට ප්‍රේෂණය කළයුතු බව දන්වා තිබුණි.

(ii) පඩි හා මිම් ආඥා පනත වෙනුවට 1995 අංක 35 දරන මිණුම් ඒකක ප්‍රමිති හා සේවා පනත නමින් පනතක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් සම්මත කර තිබුණි. එහෙත් ඊට අනුගත වන ආකාරයට ඉහත ප්‍රඥප්තිය සංශෝධනය කර නොතිබුණු අතර, මෙම විෂයය සඳහා වෙනමම ප්‍රඥප්තියක් සකස් කරගෙන නොතිබුණි. මෙම තත්ත්වය තුළ අදාළ පනත යටතේ අයකර ගැනීමට තිබූ ආදායම පළාත් සභාවට අහිමි වී තිබුණි.

(iii) යථෝක්ත ප්‍රඥප්තියේ 1 වන පරිච්ඡේදයේ 2.2 (ආ) හා 5 වගන්ති අනුව තැගි තරඟ බද්ද සම්බන්ධයෙන් පළාත් නියෝජ්‍ය පොලිස්පතිවරයා විමසා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය යුතු බව දැක්වෙන නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකී නියෝග සකස්කර නොතිබුණි.

(iv) ප්‍රඥප්තිය මගින් පහත දැක්වෙන ආඥා පනත් යටතේ අය කරනු ලබන බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු පළාත් සභාවට ලැබිය යුතු බව දක්වා ඇතත්, එකී ආඥා පනත් යටතේ සිදුකරනු ලබන අයකිරීම් විධිමත් පරිදි අයකර ගැනීම සඳහා වෙන වෙනම ප්‍රඥප්ති සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය තුළ පළාත් සභාවට ලැබිය යුතු සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

- ඉඩම් සංවර්ධන ආඥා පනත හා රාජ්‍ය ඉඩම් ආඥා පනත.
- වෛද්‍ය ආඥා පනත.
- වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට දීර්ඝ කාලීන බදු පදනම මත බදුදීම සඳහා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් ඉඩම් කැබලි 2,170 ක් හඳුනාගෙන තිබුණි.

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලබාදී ඇති තොරතුරුවල අඩුපාඩු නිසා ලිපිගොනු 957 ක්ද,

(ii) ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකඟතාවය නොමැතිවීම නිසා ලිපිගොනු 392 ක්ද,

(iii) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය නොලැබීම නිසා ඉඩම් 575 ක් සම්බන්ධයෙනුත් දිගුකාලීන බදු අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(iv) මෙම තොරතුරු අනුව හඳුනාගෙන තිබුණු ඉඩම්වලින් නියමිත පරිදි බදු අයකළ හැකි ඉඩම් ප්‍රමාණය සියයට 11.33 ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට එළදා බදු අයකිරීම සඳහා හඳුනාගෙන තිබුණු ඉඩම් 1,115 කින් ඉඩම් 65 කින් හා වාර්ෂික බදු අයකිරීම සඳහා හඳුනාගෙන තිබුණු ඉඩම් 12,556 කින් ඉඩම් 1,300 කින්ද, බදු අය නොවන බව නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ගැනුම් මිල අයකිරීම සඳහා හඳුනාගෙන තිබුණ ඉඩම් කැබලි සංඛ්‍යාව 501 ක් වූ අතර, ඉන් කැබලි 341 කින් ගැනුම් මිල අයවී නොතිබුණි. මෙම තත්ත්වය තුළ සැලකිය යුතු ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අවස්ථා අහිමිවී තිබුණි.

(එ) දකුණු පළාත් සභාවේ 2013 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 6 ඡේදය ප්‍රකාරව බලපත්‍ර ගාස්තුව, මුදල් විෂය භාර ඇමතිවරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් කලින් කලට වෙනස් කරනු ලැබිය යුතු වුවද, ඊට අනුකූලව කටයුතු නොකර බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු අයකර තිබුණි. මේ අනුව නීත්‍යානුකූල පදනමක් නොමැතිව ගාස්තු අයකිරීම තුළින් ගැටළු උද්ගත වියහැකි බව නිරීක්ෂණය විය.

4. මූල්‍ය සමාලෝචනය
----------------------

4.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.21,934,172,245 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,104,601,590 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,829,570,655 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------

4.2.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වැදගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

(i) මුළු ආදායමට ඌනතාවය
----------------------------

ඉකුත් වසර දෙකේදීම මුළු ආදායම හා සමස්ථ ඌනතාවය අතර අනුපාතය වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන අතර, සමාලෝචිත වර්ෂයේ එම අනුපාතය ඉකුත් වර්ෂයට වඩා සියයට 32 කින් ඉහළ ගොස් තිබුණි.

(ii) මුළු ආදායම හා මුළු වියදම අතර අනුපාතය
----------------------------------------------

ඉකුත් වර්ෂ දෙකේදී මුළු ආදායම හා මුළු වියදම අතර අනුපාතයේ ඉහළ යාමක් පෙන්නුම් කරන අතර, සමාලෝචිත වර්ෂයේදී එම අනුපාතය ඉකුත් වර්ෂයට වඩා සියයට 32 කින් ඉහළ ගොස් තිබුණි. එසේම මුළු ආදායමට එරෙහිව මුළු වියදම ආසන්න වශයෙන් පස් ගුණයකින් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමෙහි රු.894,016,813 ක වර්ධනයක් පෙන්නුම් කෙරෙන නමුත්, ඉකුත් වර්ෂයේ රු.2,042,951,279 ක් වූ ආදායම් විෂයයන් 03 ක ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.1,918,704,308 ක් දක්වා එනම් රු.124,246,971 කින් අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.5,478,863,427 කින් වැඩි වී තිබුණු අතර, ඊට පහත සඳහන් හේතු බලපා තිබුණි.

(i) සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි වියදම රු.20,394,361,473 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම වියදම රු.15,826,778,890 ක් විය. ඒ අනුව එම වියදම රු.4,567,582,583 කින් හෙවත් සියයට 28.86 කින් වැඩි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අනෙකුත් සැපයුම් හා සේවා වියදම රු.1,636,994,677 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම වියදම රු.1,536,171,921 ක් විය. ඒ අනුව එම වියදම රු.100,822,756 කින් හෙවත් සියයට 6.56 කින් වැඩි වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ප්‍රදානයන් සහ මාරු කිරීම් යටතේ වූ වියදම රු.3,512,009,327 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම වියදම රු.2,708,146,987 ක් වූයෙන් එම වියදම රු.803,862,340 කින් හෙවත් සියයට 29.68 කින් වැඩි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ඌනතාවය රු.19,321,513,838 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අගය රු.14,736,667,223 ක් වූයෙන්, ඌනතාවය රු.4,584,846,615 කින් හෙවත් සියයට 31.11 කින් වැඩිවී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ආයෝජන රු.2,612,658,407 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අගය රු.2,367,934,367 ක් වූයෙන් රු.244,724,040 කින් හෙවත් සියයට 10.33 කින් වැඩි වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සමස්ථ අයවැය ඌනතාවය රු.21,934,172,245 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අගය රු.17,104,601,590 ක් වූයෙන්, ඌනතාවය රු.4,829,570,655 කින් හෙවත් සියයට 28.23 කින් වැඩිවී තිබුණි.

## 5. අධිකාරි ගිණුම් /අරමුදල් ගිණුම් හා වානිජ අත්තිකාරම් ගිණුම්

----------------------------------------------------------------------------

### 5.1 අධිකාරි ගිණුම් / අරමුදල් ගිණුම්

-----------------------------------

දකුණු පළාත් සභාව තුළ ප්‍රඥප්ති යටතේ ක්‍රියාත්මක අධිකාරි 05 ක් ද, අරමුදල් 07 ක් ද පැවැති අතර, ඒවායේ 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අධිකාරියකට හා අරමුදල් 4 කට අදාළ මූල්‍ය ප්‍රකාශන පමණක් 2016 මාර්තු 31 දිනට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) අධිකාරි 3 කට සහ අරමුදලකට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 3 කට ආසන්න ප්‍රමාදයක් සහිතවද, අධිකාරියකට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 4 ක පමණ ප්‍රමාදයක් සහිතවද, විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ඇ) සමූපකාර සංවර්ධන අරමුදල විසින් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා උපචිත පදනම අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 1996 අංක 01 දරන දකුණු පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 15 (iii) ඡේදයේ හා 18 ඡේදයේ සඳහන් පරිදි ග්‍රාම සංවර්ධන අරමුදලට අදාළ මූල්‍ය ප්‍රකාශන 1996 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

----------------------------

දකුණු පළාත් සභාවට අයත් ආයතන තුළ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 11 ක් පැවති අතර, ඒවායේ මූල්‍ය ප්‍රතිඵල පහත දැක්වෙන පරිදි විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී කල්පිත ගාස්තු ගැලපීමට පෙර ලාභයක් සහිතව අත්තිකාරම් ගිණුම් 10 ක් පවත්වා තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එකී ප්‍රමාණය 08 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී කල්පිත ගාස්තු ගැලපීමෙන් අනතුරුව ලාභ ලබා තිබුණු අත්තිකාරම් ගිණුම් කටයුතු ගණන 03 ක් වූ අතර, වර්ෂ දෙකේදීම කල්පිත ගාස්තු ගැලපූ පසුව පාඩු පෙන්නුම් කළ අත්තිකාරම් ගිණුම් කටයුතු ගණන 07 ක් විය.

(ඇ) විෂයය අංක 31502 දරන සහතික කළ බීජ හා වගා ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුමට අදාළව ඉකුත් වර්ෂයේදී කල්පිත ගාස්තු ගලපා නොතිබුණි. විෂයය අංක 32049 දරන අත්තිකාරම් ගිණුමට අදාළ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 20 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්ය සාධනය

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| අරමුදල් ප්‍රභවය | යෝජිත ව්‍යාපෘති සංඛ්‍යාව | සම්පූර්ණයෙන් වැඩ නිමකළ | සියයට 50 ඉක්මවූ | සියයට 50 ට අඩු | ආරම්භ නොකළ |
|---|---|---|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,010 | 674 | 82 | 153 | 101 |
| උපමාන පාදක | 370 | 234 | 30 | 65 | 41 |
| උපමාන පාදක - මන්ත්‍රී ප්‍රතිපාදන | 2,655 | 1,880 | 246 | 245 | 284 |
| | 4,035 | 2,788 | 358 | 463 | 426 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) යෝජිත ව්‍යාපෘති 426 ක වැඩ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ii) ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 463 ක ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොතිබුණි.

(iii) යෝජිත ව්‍යාපෘති 4,035 ක් අතුරින් නිම කළ ප්‍රමාණය 2,788 ක් වූ අතර, එය සියයට 69 ක අගයක් ගෙන තිබුණි.

(ආ) විභාග ප්‍රතිඵල

---------------

අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.13,438,495,788 ක සමස්ථ වියදමක් දරා තිබුණු අතර, ඉකුත් වර්ෂයේ එම වියදම රු.10,559,429,572 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් ලඟා කරගෙන තිබුණු විභාග ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත විස්තරයක් (පළාත තුළ පිහිටි ජාතික පාසල් 66 හි විස්තරද ඇතුළත්ව) පහත දැක්වේ.

(i) 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල

---------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | ඉදිරිපත් වූ සංඛ්‍යාව | සමත්වූ සංඛ්‍යාව | ප්‍රතිශතය | අසමත් සංඛ්‍යාව | ලකුණු 70 ට වැඩියෙන් ලබාගත් සංඛ්‍යාව | ලකුණු 70 ට අඩුවෙන් ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 2015 | 41,638 | 4,337 | 10.4 | 37,301 | 33,960 | 3,341 |
| 2014 | 40,913 | 7,042 | 17.2 | 33,871 | 29,039 | 4,832 |

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට වඩා වැඩිපුර අපේක්ෂකයින් 725 දෙනෙකු විභාගයට ඉදිරිපත් වුවද, සමත්වූ සංඛ්‍යාව 2,705 කින් අඩුවී තිබුණි.
- ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අසමත් සංඛ්‍යාව 3,430 කින් වැඩිවී ඇති බවත්, ලකුණු 70 ට වඩා අඩුවෙන් ගත් සංඛ්‍යාවේ 1,491 ක අඩුවීමක් පවතින බවත් නිරීක්ෂණය විය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ අ.පො.ස(සා.පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | ඉදිරිපත් වූ සංඛ්‍යාව | උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | ප්‍රතිශතය | සියළු විෂයයන් සඳහා“A” සාමාර්ථ ලබාගත් සංඛ්‍යාව | සියළු විෂයයන් අසමත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 2015 | 34,801 | 26,173 | 75.2 | 730 | 722 |
| 2014 | 33,145 | 24,223 | 73.1 | 594 | 793 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සාමාන්‍ය පෙළ ප්‍රතිඵල වර්ධනයක් පෙන්නුම් කෙරුණු අතර, විභාගයට ඉදිරිපත්වූ සංඛ්‍යාවෙන් 722 දෙදෙනෙකු සියලුම විෂයයන් අසමත්වී තිබුණි.

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | ඉදිරිපත් වූ සංඛ්‍යාව | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | ප්‍රතිශතය | සියළු විෂයයන් අසමත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2015 | 28,512 | 17,276 | 60.5 | 2,779 |
| 2014 | 29,506 | 18,345 | 62.1 | 3,224 |

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

- ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විභාගයට ඉදිරිපත්වූ සංඛ්‍යාව 994 කින් අඩුවී තිබුණි.
- විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී 1,069 කින් අඩුවී තිබුණි.
- විභාගයට ඉදිරිපත්වූ සිසුන්ගෙන් 2,779 දෙනෙකු සියළු විෂයයන් අසමත්වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එම සංඛ්‍යාව 3224 ක් වී තිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ පවතින අතිරික්ත මුදල් කෙටි කාලීන ඉතුරුම්වල ආයෝජනය කිරීම මගින් උපයාගෙන තිබුණු පොලිය එම බැංකුවේම ඉතිරි කිරීමේ ගිණුමකට මාරු කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.87,395,876 ක් වූ අතර, දකුණු පළාත් සභාවේ කාර්යයන් සඳහා එකී මුදල් යොදවා නොගැනීමේ අරමුණ විගණනයේදී පැහැදිලි නොවේ.

(ආ) වසර ගණනාවක සිට ක්ෂය සංචිත අරමුදල් ගිණුමේ ඉදිරියට ගෙන එන ශේෂය රු.1,944,009 ක් වුවද, ඊට අදාළ ප්‍රතිපාදන වෙන්කර ගෙන ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ක්ෂය නිදන් අරමුදල් ගිණුමේ වූ රු.60,243,372 ක ශේෂයෙන් රු.5,489,479 ක් පමණක් ආයෝජනය කර තිබුණි.

(ඈ) දකුණු පළාත් සභා කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන ඒ අනුව ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු රු.31,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.22,466,949 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ඉ) ආදායම් රැස් කිරීම් ගිණුම්වලින් දකුණු පළාත් සභා අරමුදලට දෛනිකව මුදල් බැර කෙරෙන ආකාරයේ වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක නොකිරීම නිසා, රැස්කිරීම්වලට අදාළ බැංකු ජංගම ගිණුම් තුළ අනවශ්‍ය ලෙස මුදල් ශේෂ රැස්වන බව නිරීක්ෂණය විය. පළාත් සභාවට අමතර ආදායම් උපයා ගැනීමට තිබුණු අවස්ථා මෙමඟින් අහිමි වී ඇති බවත්, මෙය මූල්‍ය පාලනයේ හිතකර තත්ත්වයක් නොවන බවත් නිරීක්ෂණය විය.

(ඊ) 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව සෑම මසකම වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ඊළඟ මස 15 දිනට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යැවිය යුතු වුවද, පළාත් පාලන ආයතනවලට අදාළ සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 04 සඳහා වූ එකතුව රු.15,781,883 ක දායක මුදල් එම දෙපාර්තමේන්තුවට යැවීම 2016 ජනවාරි මාසය දක්වා ප්‍රමාදවී තිබුණි.

(උ) දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලට අයත් වාහන අනතුරු සම්බන්ධයෙන් අවස්ථා 74 කට අදාළ රු.10,292,861 ක හානි හා අවස්ථා 119 කට අදාළ රු.37,326,417 ක දේපල හානි වසර ගණනාවක් තිස්සේ නොවිසඳී පවතින නමුත්, මෙම වාහන සහ දේපල හානි නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඌ) නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විසර්ජන ගිණුම්වල ඉදිරිපත් කර දක්වා නොතිබුණු වාහන අනතුරු 12 ක් හා දේපල හානි 5 ක් ඇතුළුව අවස්ථා 17 කට අදාළ අලාභ හානිවල එකතු වටිනාකම රු.52,534,686 ක් වූ අතර, තවත් වාහන අනතුරු 3 ක් හා දේපල හානි 2 ක් ඇතුළුව අවස්ථා 05 කට අදාළ හානිවල වටිනාකම ගණනය කර නොතිබුණි.

(එ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2015 ඔක්තෝබර් 30 දිනට කල්පිරෙන හා සියයට 6 ක වාර්ෂික පොලිය යටතේ ස්වයංක්‍රීයව අළුත්වන රු.41,236,000 ක ස්ථාවර තැන්පතුව කල්පිරීමට පෙර මුදල් කර ගැනීම නිසා උපයාගැනීමට හැකිව තිබුණු රු.135,570 ක පොලී ආදායම් අහිමි වී තිබුණි.

(ඒ) (i) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ ඒ යටතේ ඇති ආයතනවල සේවයේ යෙදී සිටියදී, මියගිය සේවකයින්ගේ බාලවයස්කාර ළමයින් වෙනුවෙන් 1966 වර්ෂයේ සිට 1992 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ඉතිරි කිරීමේ බැංකුවේ ආරම්භ කර තිබුණු, බාලවයස්කාර ගිණුම් 102 කට අදාළ තැන්පතු සහතික තැන්පත්ලාභීන්ගේ වයස සම්පූර්ණවී සැලකිය යුතු කාලයක් ගතවී තිබියදීත් ඔවුන්ට භාරදී නොතිබුණි.

(ii) 2016 ජුනි මස 30 දින වන විටත්, තැන්පතු සහතික 85 ක් භාරදීමට කටයුතු කර නොතිබුණු අතර, එදිනට ඉන් ගිණුම් 06 කට අදාළ ශේෂවල එකතුව රු.332,278 ක් විය. ඉතිරිකිරීම් ගිණුම් 79 ට අදාළ ශේෂ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, එම ගිණුම්වල ආරම්භක තැන්පතු ශේෂවල එකතුව රු.52,591 ක් වී තිබුණි.

(ඔ) එක් වඩු කාර්මිකයෙකු පමණක් සේවය කරන හා අඩු සේවා ප්‍රමාණයක් සිදු කරන පෝද්දල වඩු සේවා මධ්‍යස්ථානය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.500,000 ක වඩු උපකරණ මිලදී ගෙන 2016 ජූලි 05 දින වන විටත් ප්‍රධාන කාර්යාලයේ රඳවාගෙන තිබුණි. රු.260,000 ක් වටිනා වඩු කාර්මික යන්ත්‍ර 02 ක් ගෙන්වා නොගෙන සැපයුම්කරුභාරයේ රඳවා තබා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඕ) සමූපකාර සමිති සේවකයන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.877,777 ක් වැය කර තිබුණද, 2016 අගෝස්තු 15 දින වන විට එකී වැඩසටහන ආරම්භක දැනුවත් කිරීමේ රැස්වීම් මාලාවකට පමණක් සීමා වී තිබුණි. ඒ අනුව වැඩසටහන සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් බව නිරීක්ෂණය විය.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ බදු ආදායම් රැස් කිරීමට ඍජුවම සම්බන්ධ සංවර්ධන නිලධාරීන්ගේ තථ්‍ය කාර්ය මණ්ඩලය 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සියයට 127 කින් සහ සමස්ථ වියදම සියයට 78 කින් වර්ධනය වී තිබියදීත්, ආදායම් රැස්කිරීම සියයට 20 කින් අඩුවී තිබුණි.

(ආ) රජයේ ඉඩම්වල බදු අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිසි අධීක්ෂණයක් සිදු නොවන බව ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 හි පිළිවෙලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක්, 06 ක් හා 07 ක් විසින් රැස් නොකළ ආදායම්වල එකතුව රු.29,429,750 ක් වීමෙන් තහවුරුවී ඇත. එම අගය අපේක්ෂිත ආදායමෙන් සියයට 66 ක් වී තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වසර 03 ක කාලය තුළ ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල මැනුම් කටයුතු සිදුකළ යුතු ඉඩම් ඒකක 240 කින් ඉඩම් ඒකක 132 ක වැඩ අවසන් කර නොතිබුණි. ප්‍රතිශතයක් වශයෙන් එම අගය සියයට 55 ක් පමණ විය.

(ඈ) කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රුහුණු රන්සළු අලෙවිසැල් 10 ක් සඳහා රු.1,775,000 ක වියදමින් ස්ථාපිත කර තිබෙන POS පරිගණක පද්ධතියෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගෙන නොමැති බවත්, තෝරාගත් අලෙවිසැල් සඳහා පමණක් මෙම POS පරිගණක පද්ධතිය සීමාවී ඇති බවත්, අනාවරණය විය.

(ඉ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.3,491,480 ක් වූ මිලදී ගැනීම් 09 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී සිදුකර තිබුණි. වර්ෂය අවසානයේ ඉතිරි පුනරාවර්තන ප්‍රතිපාදන මූල්‍ය රීති 30 මගින් මාරුකර ගෙන මෙම මිලදී ගැනීම් සිදුකළ බව, පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් 2016 අප්‍රේල් 20 දින විගණනයට දන්වා තිබුණි.

6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා රාජකාරී කටයුත්තක් සඳහා 2015 ජුනි 30 දින පිටත්වී තිබුණ වාහනය 2015 ජුලි 01 රජයේ නිවාඩු දිනයේ බාහිර පුද්ගලයෙකු සමඟ ගමන් කරමින් සිටියදී අනතුරට ලක්වී තිබුණි. අනතුර සිදුවූ ස්ථානයේ වාහනය තිබියදී ඉංජිනේරුවරයා එම ස්ථානයෙන් ඉවත්ව ගොස් තිබුණි. මේ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු 2016 සැප්තැම්බර් 15 දක්වා අවසන්වී නොතිබුණි.

(ආ) (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහනයක් 2014 දෙසැම්බර් 02 වන දින විෂයභාර අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරී වෙත මුදාහැර 2015 මැයි 12 දින නැවත භාරගෙන රු.95,708 ක වියදමින් අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව 2015 ජුලි 24 දින නැවත එම නිලධාරියා වෙත භාර දී තිබුණි.

(ii) කෙසේ වෙතත් එම වාහනය භාරදී ඇත්තේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති වෙත බව යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් සාමාන්‍යාධිකාරීවරයා වෙත යොමුකර තිබුණු අංක දප/මාසංඅදියාඉ/ වාහන දරන 2015 අප්‍රේල් 28 දිනැති ලිපිය මගින් තහවුරු කර තිබුණි.

(ඇ) මාතර සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයට ලබා දී තිබුණු අංක 51-0674 දරන කැබ් රථය අළුත්වැඩියාව සඳහා ගරාජයක් වෙත යොමුකර තිබුණි. යොමුකළ දිනය නිශ්චිතවම හඳුනාගත නොහැකි වූ අතර අළුත් වැඩියාවට අදාළව 2010 අප්‍රේල් 10 දින රු.88,899 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණ නමුත්,2016 පෙබරවාරි 01 දින වන විටත් මෙම වාහනය ගරාජයේ හිමිකරුට අයත් පුද්ගලික ඉඩමක දිරාපත් වෙමින් පැවතුණි. එසේම මෙහි අමතර කොටස් රාශියක් ගලවා ඉවත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, වාර්ෂික වාහන සංගණනයට මෙම වාහනය පිළිබඳ තොරතුරු ලබාදී නොතිබුණි. ඒ අනුව හිතාමතාම රජයේ සම්පත් විනාශවීමට ඉඩ හැර ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අලුතින් සේවයට බඳවාගත් මුරකරුවන් 42 දෙනෙකුට නියමිත වැටුප් තලයේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා වැටුප් නොගෙවා , 12 වන පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.5,155,293 ක් වැටුප් හා දීමනා ලෙස වැඩිපුර ගෙවා ඇති බව නිරීක්‍ෂණය විය.

(ඉ) ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් තුළ පිහිටි රජයේ ඉඩම් කට්ටි 19 ක පෞද්ගලික දුරකථන සමාගම් 06 ක් විසින් දුරකථන සන්නිවේදන කුළුණු 19 ක් ස්ථාපිත කර සම්ප්‍රේෂණ කටයුතු ආරම්භ කර තිබුණු නමුත්, ඒ වෙනුවෙන් අදාළ බදු මුදල් රජයට ගෙවා නොතිබුණි.

(ඊ) ප්‍රධාන ලේකම් කාර්යාලය සතු නිල වාහනයක් සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා ධාවනය නොකළ කිලෝමීටර් 3640 ක් සඳහා රු.53,235 ක් වටිනා ඉන්ධන ලීටර් 455 ක් වැඩිපුර ලබාදී තිබුණි.

(උ) 2011 වර්ෂයේදී පළාත් සභා ඇමැතිවරුන් හා මන්ත්‍රීවරුන් වෙත ලැප්ටොප් පරිගණක 55 ක් ලබාදීම සඳහා රු.7,920,000 ක් වැයකර ඇති නමුත් එකී පරිගණක ඔවුන්ට භාරදුන් බවට හෝ භාරගත් බවට හෝ ඔවුන් විසින් නැවත භාරදුන් බවට කිසිඳු ලිඛිත සාක්ෂියක් නොවීය. එසේ තිබියදී, 2015 වර්ෂයේදී රු.8,132,350 ක් වැයකර

නැවත ලැප්ටොප් පරිගණක හා ටැබ් යන්ත්‍ර මිලදී ගෙන පළාත් අමාත්‍යාවරුන් ඇතුළු මන්ත්‍රීවරුන්ට ලබාදී තිබුණි.

(ඌ) (i) රුහුණු සංචාරක කාර්යාංශයේ සේවකයෙකු නොවන සභාපතිවරයා වෙනුවෙන් 2014 මැයි මස සිට 2016 අගෝස්තු මස දක්වා සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට රු.189,000 ක දායක මුදල් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

(ii) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවකයින් නොවන සභාපතිවරුන් පස්දෙනෙකු වෙනුවෙන් 1994 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට රු.1,032,960 ක දායක මුදල් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(එ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මුහුණත අගය රු.159,313,647 ක් වූ ස්ථාවර තැන්පතු සහතික 78 ක් ආරක්ෂිත සේප්පුවේ තැන්පත් කර නොතිබූ බැවින්, මෙකී ස්ථාවර තැන්පතු සහතිකවලට අමතරව තවත්, ස්ථාවර තැන්පතු සහතික තිබුණේද යන්න පිළිබඳව තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඒ) (i) දකුණු පළාත් සභාවේ 1992 අංක 02 දරන මුදල් (සංශෝධිත) ප්‍රඥප්තිය මගින් සංශෝධිත 1990 අංක 07 දරන දකුණු පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තියේ 104(අ)(1) වගන්තියෙහි පළාත් දිරිගැන්වීමේ අරමුදල යනුවෙන් අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුබව සඳහන් වේ. එසේම 104(4)(2) වගන්තිය අනුව මෙම අරමුදලට 1991 වර්ෂයේදී පරිපූරක ආධාර මුදලක් වශයෙන් පළාත් සභාව ඉදිරියේ තබනු ලබන මුදලක් හා ඊට පසුව පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල් බැර කළයුතු බව දැක්වේ.

(ii) පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂය දක්වා පළාත් දිරිගැන්වීමේ අරමුදල ස්ථාපිත කර නොතිබුණි. කෙසේ වෙතත් විධිමත් අනුමැතියක් රහිතව දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් දිරිදීමනා ගෙවමින් පැවති අතර, සමාලෝචිත වර්ෂයේදී රු.16,763,488 ක් දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඔ) දෙනියාය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.4,842,413 ක වියදම් දරා තිබුණි. 2016 අගෝස්තු 31 දින වන විටත් එහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණු නමුත්, එම වියදම මත 2015 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල සියයට 5 බැගින් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි. ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පැවතියද, එකී ඉඩමේ අයිතිය පවරා ගැනීමට 2016 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

6.5 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකු 2015 වර්ෂයේදී ඉන්ධන ලීටර් 6586 ක් සඳහා රු.632,698 ක් දීමනා ලබාගෙන තිබියදී, ජනාධිපති ලේකම්ගේ අංක C.S.A/1/40 දරන හා 2008 අප්‍රේල් 23 දිනැති චක්‍රලේඛයට අනුකූල නොවී ඉන්ධන ඇණවුම් මගින්ද ඉන්ධන ලීටර් 4594 ක් එම නිලධාරීන්ට ලබාදී තිබුණි.

(ආ) ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර පත්වීම් ලබාගෙන තිබූ අම්බලන්ගොඩ කලාපයේ ගුරුවරියන් දෙදෙනෙකු විනය පරීක්ෂණය මඟින් වරදකරුවන් බව තහවුරු වී තිබියදීත්, එක් ගුරුවරියක් පමණක් සේවයෙන් පහකර අනෙක් ගුරුවරිය තවදුරටත් සේවයේ යොදවාගෙන තිබුණි. ඒ අනුව එකම වරදක් සඳහා ආකාර දෙකකට ක්‍රියාත්මකවී තිබුණු අතර, ව්‍යාජ සහිතක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගුරුවරියන් දෙදෙනාටම එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) (i) ව්‍යාජ සහතික (කූඨ ලේඛන) ඉදිරිපත් කර විදුහල්පති සේවයට, ගුරු සේවයට හා අනිකුත් සේවාවලට පත්වීම් ලබාගෙන දකුණු පළාත තුළ සේවය කරන පුද්ගලයින් 76 දෙනෙකු සිටින බව සමාලෝචිත වර්ෂය ආරම්භයට හඳුනාගෙන තිබුණි.

(ii) පවත්වන ලද විනය පරීක්ෂණවලට අනුව පුද්ගලයින් 05 දෙනෙකු එකී චෝදනාවලින් නිදහස්වී තිබුණු අතර, තවත් 12 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. 59 දෙනෙකුට අදාළ විනය පරීක්ෂණ අවසන්වී නොතිබුණු අතර, ඉන් 39 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී වැටුප් දීමනා ලෙස රු.16,290,518 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) (i) 2014 ඔක්තෝබර් 16 දින රු.7,076,250 ක වටිනාකමට දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් මත සහතිකයක් ලබාදී තිබුණු ඉඩමක්, ඊට දින 8 කට පසුව එනම් 2014 ඔක්තෝබර් 24 දින එකම නීතීඥවරයෙකු විසින් එක ළඟ අංක සහිත විකුණුම්කර දෙකක් මඟින් රු.600,000 කට හා රු.7,076,250 කට හුවමාරු කර තිබුණි.

(ii) මත සහතිකයේ වටිනාකමට වඩා අඩුවෙන් විකුණුම්කරයක් සහතික කිරීම නිසා රජයට රු.259,050 ක මුද්දර බදු අහිමි වී තිබුණු අතර, නියමිත මිලට වූ විකුණුම්කරයට අදාළ මුද්දර බදු මුදල විධිමත් අනුමැතියක් නොමැතිව පළාත් ආදායම් කොමසාරිස් විසින් නිදහස් කර තිබුණි.

(ඉ) (i) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද ප්‍රජාශාලා හතරක් සඳහා ගෙවීම් කිරීමේදී මූල්‍ය අක්‍රමිකතා සිදුවී තිබූ බවත්, අසතුටුදායක ලෙස ඉදිකිරීම් කර තිබූ බවත්, නිරීක්ෂණය විය. මෙහිදී වැඩිපුර ගෙවන ලද මුදල හා අදාළ වැඩ කොටස් නිවැරදි කිරීම සඳහා වැය වන මුදල සමඟ රු.1,944,878 ක අක්‍රමිකතාවයක් සිදුවී ඇති බව වෘත්තීය තාක්ෂණික කමිටු වාර්තාව මඟින් තහවුරු කර තිබුණි.

(ii) 2009 මැයි 15 දින විගණන විමසුමක් මඟින් මෙම කාරණය පෙන්වාදීමෙන් අනතුරුව, 2009 ඔක්තෝබර් 09 දින තාක්ෂණික වාර්තාව ලබාදී තිබුණි. වාර්තාව ලබාදී වසර 7 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, පළාත් සභා අරමුදලට සිදුවී ඇති පාඩුව ආපසු අයකර ගැනීමට මෙන්ම, වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු කර නොතිබුණි.

6.6 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී පහත විස්තර දැක්වෙන වැය විෂයයන් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය සහ ඉන් දරන ලද වියදම් සහ ඉතිරි වූ ප්‍රතිපාදන පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වියදම් විස්තරය | වියදම් විෂයයන් සංඛ්‍යාව | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන වියදම් | 122 | 132,123,800 | 34,550,146 | 97,573,654 | 73.85 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 17 | 140,000,000 | 46,035,286 | 93,964,714 | 67.12 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 7 | 78,127,000 | 7,790,441 | 70,336,559 | 90.03 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | 4 | 85,080,000 | 25,862,117 | 59,217,883 | 69.60 |
| මානව සම්පත් සංවර්ධනය | 1 | 31,000,000 | 8,533,051 | 22,466,949 | 72.47 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 8 | 2,546,300,000 | 580,429,002 | 1,965,870,998 | 77.21 |
| රේඛීය අමාත්‍යාංශ මඟින් කෙරෙන ආයෝජන | 1 | 3,107,800 | 978,216 | 2,129,584 | 68.52 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) පළාත් පුනරාවර්තන වියදම්

------------------------------

- ❖ ශීර්ෂ 06 කට අයත් වැය විෂයයන් 15 ක් වෙනුවෙන් සලසා තිබුණු රු.6,035,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.
- ❖ ශීර්ෂ 14 කට අයත් වැය විෂයයන් 107 ක් වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 50 සිට සියයට 99.62 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.

(ii) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම

----------------------------------------------------------

- ❖ ශීර්ෂ 02 කට අයත් වැය විෂයයන් 02 ක් යටතේ සලසා තිබුණු රු.3,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

- ❖ ශීර්ෂ 06 කට අයත් වැය විෂයයන් 15 ක් වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 53 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී පැවතුණි.

(iii) ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම

----------------------------------------

- ❖ ශීර්ෂ 02 කට අයත් වැය විෂයයන් 02 ක් වෙනුවෙන් සලසා තිබූණු රු.3,227,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

- ❖ අංක 320 දරන ශීර්ෂයේ වැය විෂයයන් 05 ක් වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 69 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(iv) ප්‍රාග්ධන මාරු කිරීම් සඳහා ශීර්ෂ 03 ක වැය විෂයයන් 4 ක් යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 53 සිට සියයට 92 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.

(v) පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන

-----------------------------------------

- ❖ වැය විෂයයක් වෙනුවෙන් සලසා තිබූණු රු.9,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

- ❖ ශීර්ෂ 03 කට අයත් වැය විෂයයන් 07 ක් වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 40 සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී පැවතුණි.

(vi) රේඛීය අමාත්‍යාංශ මඟින් කෙරෙන ආයෝජන යටතේ වැය විෂයයක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 68 කට වැඩි ඉතිරිවීම් පැවතිණි.

ඉහත අංක (i) සිට (vi) දක්වා ඡේදවල දැක්වෙන තොරතුරු අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළුව දකුණු පළාත් සභාවේ සියලුම ආයතනවලට අයත් බැංකු ජංගම ගිණුම් 192 කින් බැංකු ජංගම ගිණුම් 119 ක තොරතුරු අනුව රු.මිලියන 462 ක පමණ සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් බැංකු ගිණුම්වල රඳවා ගෙන ඇති බව අනාවරණය විය. මෙය මූල්‍ය කළමනාකරණය අතින් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය විය.

6.7 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන ... අමාත්‍යාංශය විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර, හදිසි මිලදී ගැනීමක් ලෙස මාධ්‍යවේදීන්ට බෙදාදීම පිණිස 2014 දෙසැම්බර් 31 දින රු.927,000 ක වියදම් දරා ටැබ් යන්ත්‍ර 18 ක් මිලදී ගෙන තිබුණි. වසර දෙකක වගකීම් කාලයක් සහිත මෙම උපකරණ 2016 ජූනි 30 දින වනවිටත් කිසිඳු ඵලදායි කාර්යයකට යොදවා නොගෙන අමාත්‍යාංශ ගබඩාවේ රඳවා තිබුණි.

(ආ) (i) රු.මිලියන 14 ක් ඉක්මවූ වියදම් දරා ගාල්ල කලාපයට අයත් විදුහලක ඉදිකර තිබුණු වර්ග අඩි 5200 ක ප්‍රමාණයේ ක්‍රීඩාගාරයක් 2014 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii) ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ගාල්ල කලාපයට අයත් මහා විද්‍යාලයක ඉදිකර තිබූ ගොඩනැගිල්ල හා පරිගණක 20 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) පුහුණු උපදේශකවරයෙකු නොමැතිකමින් කිතලගම වඩු පාසල වසා දැමීම නිසා රු.353,493 ක් වටිනා උපකරණ, රු.21,442 ක් වටිනා අමුද්‍රව්‍ය සහ රු.51,600 ක් වටිනා නිමි ද්‍රව්‍ය තොග ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 29 දින මිලදී ගෙන තිබූ රු.660,000 ක් වූ දන්ත වෛද්‍ය උපකරණ 07 ක් 2016 ජූලි 29 දින වනවිටත් රෝගී සත්කාරක සේවා සඳහා යොදා නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

(ඉ) දේනුවල සංචාරක විවේකාංගනය ඉදිකිරීම හා ඊට අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.14,311,586 ක්ද, නඩත්තු, පරිපාලන හා ආරක්ෂක සේවා සඳහා රු.1,232,492 ක් වශයෙන් එකතුව රු.15,544,078 ක වියදම් දරා තිබුණි. 2015 දෙසැම්බර් 31 වන විටත් සංචාරක කර්මාන්තයට ඉන් කිසිඳු දායකත්වයක් ලැබී නොතිබුණු බැවින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

(ඊ) සමුද්‍ර පුරාවිද්‍යා සංචාරක නියමු ව්‍යාපෘතිය යටතේ උපකරණ මිලදී ගැනීම, ප්‍රචාරක කටයුතු හා සේවක වැටුප් ගෙවීම යන කටයුතු වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.6,335,326 ක වියදම් දරා තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂය අවසානය දක්වාම මෙම උපකරණ කිසිඳු ඵලදායී කටයුත්තකට යොදවා නොගැනීම නිසා ඉන් කිසිඳු ආදායමක් උපයාගැනීමට නොහැකිවීමෙන් දරන ලද වියදමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි.

(උ) (i) අම්බලන්ගොඩ නගර සභාව සතු ඉඩමක සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා රුහුණු සංචාරක කාර්යාංශය විසින් 2008 වසරේ සිට 2012 වසර දක්වා රු.5,098,639 ක වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට මෙම ඉදිකිරීම් අත්හැර තිබුණු බැවින්, දරන ලද වියදම නිෂ්ඵලවී තිබුණි.

(ii) සැලසුම් සකස් කිරීම සඳහා දරා තිබුණු රු.4,165,524 ක වියදම මත 2009 වර්ෂයේ සිට වාර්ෂිකව සියයට 5 බැගින් මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඌ) (i) රුහුණු සංචාරක කාර්යාංශයට පවරා නොගත් ඉඩමක 2010 වසරේ සිට 2014 වසර දක්වා කාලය තුළ රු.48,301,192 ක වියදම් දරා හික්කඩුව සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. 2016 අගෝස්තු 31 දින දක්වාම මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයකට යොදවා ගෙන නොතිබුණි.

(ii) ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණු නමුත්, දරන ලද වියදම මත 2011 වර්ෂයේ සිට වාර්ෂිකව සියයට 5 බැගින් මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(එ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් දසුන ණය ව්‍යාපෘතිය වෙනුවෙන් ගාල්ල කොටුව මහජන බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුම රු.473,418 ක ශේෂයක් සහිතව වසර 2 ක කාලයක් තිස්සේ අක්‍රීය තත්ත්වයෙන් පවත්වා තිබුණි.

(ඒ) දකුණු පළාත් උපමාන පාදක සංවර්ධන සැලැස්ම (මන්ත්‍රී ප්‍රතිපාදන ) යටතේ 2014 වර්ෂයේදී රු.349,270 ක වියදමින් මිලදී ගෙන තිබුණු දියර ඉසින යන්ත්‍ර10 ක් සහ අඟල් 9 x 9 ප්‍රමාණයේ උදළු තල 303 ක් සහ 2015 වර්ෂයේදී රු.395,640 ක වියදමින් මිලදී ගෙන තිබුණු දියර ඉසින යන්ත්‍ර 36 ක් 2016 ජූලි 29 දින වන විටත් අදාළ කාර්යයන් සඳහා යොදවා නොගෙන මාතර දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල ගබඩාවේ රඳවා තිබුණි.

(ඔ) ලබුදූව ගොවිපල අළෙවි සැලට කේක් මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2014 දෙසැම්බර් 31 දින කිසිඳු ඇප බැඳුම්කරයක් ලබානොගෙන රු.123,370 ක් වූ සියයට 25 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර , ඉතිරිය සඳහා එදිනම ලියන ලද රු.370,110 ක චෙක්පත දින 47 ක් රඳවාගෙන පසුව සැපයුම්කරුට භාරදී තිබුණි. අදාළ කේක් මිශ්‍රණ යන්ත්‍රය 2015 සැප්තැම්බර් 10 දින ලැබී තිබුණු නමුත්, තෙකලා විදුලි ධාරිතාවය නොමැතිවීම මත 2016 ජූලි 21 දින වන විටත් යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවතුණි .

(ඕ) ක්‍රීඩා, ග්‍රාම සංවර්ධන ... අමාත්‍යාංශය විසින් 1997 වර්ෂයේදී රු.3,700,000 කට මිලදී ගෙන තිබුණු ටොයෝටා ප්‍රාඩෝ වර්ගයේ ජීප් රථය අවශ්‍ය අළුත්වැඩියාවන් නොකිරීම හේතුවෙන්, 2014 දෙසැම්බර් මාසයේ සිට 2016 අගෝස්තු 31 දක්වා නිශ්ක්‍රීය තත්ත්වයෙන් ආයතන පරිශ්‍රයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

6.8 අර්ථික නොවූ ගනුදෙනු
------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල වෘත්තීය පුහුණුව ලබාදීමේ අරමුණින් පිහිටුවා ඇති කාර්මික පාසල් 03 ක් විසින් 2015 වර්ෂය තුළදී එක් ආධුනිකයකු හෝ බඳවාගෙන නොතිබුණු නමුත්, එම ආයතන භාරව කටයුතු කරන උපදේශකවරුන්ට හා අනෙකුත් කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.3,294,672 ක වියදම් දරා තිබුණි.

(ආ) බද්දේගම පශු වෛද්‍ය කාර්යාලයට අයත් ජීප් රථය රු.106,680 ක වියදමින් අළුත්වැඩියා කර තිබුණද, 2015 ඔක්තෝබර් 01 දිනෙන් පසුව ධාවන කටයුතු සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ඇ) ඇල්පිටිය පශු වෛද්‍ය කාර්යාලයට අයත් රජයේ නිවාසය 2014 වර්ෂයේ අවස්ථා දෙකකදී රු.1,319,058 ක වියදම් දරා අළුත්වැඩියා කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් පදිංචිය සඳහා නිවාසය යොදවා නොගෙන වසා දමා තිබුණි.

6.9 හඳුනාගන්නා ලද පාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 නොවැම්බර් මස අනතුරකට භාජනය වී තිබුණු ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථයේ අළුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික ආයතන 02 ක් වෙත ඉදිරිපත් කර තිබුණද, වසර 07 ක් තිස්සේ අළුත්වැඩියා කටයුතු සිදු නොකිරීම නිසා වාහනය දිරාපත් වෙමින් පැවතුණි. අනතුරින් වාහනයට සිදුවූ රු.775,699 ක අලාභය රක්ෂණ හිමිකම් මගින් හෝ අදාළ වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර ඔවුන්ගෙන් හෝ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) (i) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2003 වර්ෂයේ දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන හා පුහුණු (පුද්ගලික) සමාගමෙහි කොටස් 30,000 ක් මිලදී ගැනීම සඳහා රු.3,000,000 ක් ආයෝජනය කර තිබුණු අතර, සමාගම සතු බස් දෙකක් විකුණා ඉන් රු.1,000,000 අධිකාරියට ලබා දී තිබුණි.

(ii) වර්තමානයේ මෙම සමාගම ක්‍රියාත්මක නොවන බැවින්, ඉතිරි රු.2,000,000 ක මුදල අය කර ගැනීමේ අවිනිශ්චිතභාවයක් පැවතුණි. 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මෙම ආයෝජනය තුළින් අධිකාරියට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) හි විධිවිධානවලට අනුකූල නොවී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තරඟකාරී මිල කැඳවීමකින් තොරව 2015 වර්ෂයේදී කොන්ත්‍රාත් වටිනාකම රු.91,650,782 ක් වූ ව්‍යාපෘති 75 ක් හා 2016 ජුනි දක්වා කොන්ත්‍රාත් වටිනාකම රු.98,930,822 ක් වූ ව්‍යාපෘති 74 ක් වශයෙන්, රු.මිලියන 02 ට අඩු ව්‍යාපෘති 149 ක් හා කොන්ත්‍රාත් වටිනාකම රු.19,677,463 ක් වූ රු.මිලියන 02 ට වැඩි ව්‍යාපෘති 06 ක්ද ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලියා පදිංචි සමිති මගින් ඉටුකරවා ගැනීම නිසා රජයට ලබා ගැනීමට තිබූ ආර්ථික වාසි අහිමි වී තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී විශේෂ ව්‍යාපෘති යටතේ දෙයියන්දර රෝහලේ සායන සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.8,497,820 ක ඇස්තමේන්තුවක් මත පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී තිබූ අතර, 2013 දෙසැම්බර් 31 දින දක්වා රු.1,876,975 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වුවද, එදිනෙන් පසු කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදුකර නොතිබුණි.

(ඇ) ජංගම වේදිකාවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා යොදාගෙන තිබුණු අමුද්‍රව්‍යවල වටිනාකම ඉක්මවා රු.181,695 ක් සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) (i) බද්දේගම මාකුරුගොඩ පිහිටි දකුණු පළාත් ක්‍රීඩා මධ්‍යස්ථානය සහ ක්‍රීඩාපිටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2001 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.142,397,350 ක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර, ඉන් රු.59,960,884 ක වියදම් දරා තිබුණි. 2012 වර්ෂයේදී වෙන් කර තිබුණු රු.40,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.26,430,235 ක් වර්ෂය අවසානයේදී පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. 2016 ජුනි 30 දින වන විටත් ඉන් රු.22,290,235 ක් තවදුරටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ii) ව්‍යාපෘතිය ආරම්භයේ සිට ඉදිකිරීම් කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවති අතර, 2015 සහ 2016 වර්ෂයන්හි දී බිල්පත් කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර 15 ක් ඉක්ම ගියද, එකී ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට මෙන්ම දරන ලද වියදමින් ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 16 ක විශාලත්වයෙන් යුතු ඉඩම අත්පත්කර ගැනීම සඳහා 2001 වර්ෂයේදී බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණු රු.800,000 ක මුදල 2016 වර්ෂය දක්වාම එම ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iv) 2008 වර්ෂයේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ඉඩම සඳහා ලබාදී තිබුණු රු.31,500,000 ක තක්සේරුවට අදාළ මුදල ගෙවා ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු 2016 ජුනි 30 දක්වා ප්‍රමාද වෙමින් පැවතුණි.

(ඉ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් වැලිගම වාර්ලිමවුන්ට් කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීමේ කර්මාන්තයේ අදියර අංක 5 සහ අංක 6 යටතේ වූ මාර්ග කොටස් නවීකරණය කිරීමේදී මිලි මීටර් 100 ගල් යොදා නොතිබියදී, යෙදූ බවට සහතික කර රු.409,349 ක් වැඩිපුර ගෙවා තිබුණි. මාර්ගයේ මිලි මීටර් 100 ගල් ස්ථරය නොයොදා මිලි මීටර් 37.5 සහ මිලි මීටර් 19 ගල් පමණක් යොදා තාර දමා නිසි ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණු බැවින්, මෙම මාර්ග කොටස් දෙක වැඩිදියුණු කිරීම සඳහා දරා තිබුණු රු.1,690,560 ක වියදම නිෂ්ඵලවී තිබුණි.

6.11 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 ජුලි 13 දින ප්‍රධාන ලේකම් විසින් ලෝක බැංකු ව්‍යාපෘතියට අදාළ 2015 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර තිබුණු බැවින්, 2015 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් 23 ක්ද, පාසල් ගොඩනැගිලි අළුත්වැඩියාවන් 24 ක් සහ සැපයීම් 06 ක කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. එම හේතුව නිසා සැලසුම් කරන ලද ව්‍යාපෘතිවලින් සියයට 77 ක ප්‍රතිශතයක් අවිච්ඡේද කිරීමට සිදුවී තිබුණි.

(ආ) මාතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධන වැඩසටහන යටතේ 2015 වර්ෂය සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ රෝගී සත්කාරය වෙනුවෙන් අනුමත කර තිබුණු රු.1,266,300 ක ප්‍රතිපාදනවලට අදාළ කාර්යයන් 07 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

(ඇ) මාතර දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් රු.786,433 ක ඇස්තමේන්තුවක් මත ගිවිසුම්ගතවී තිබුණු පොල්කඳවෙල්ල අමුණ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

(ඈ) උපමාන පාදක ප්‍රදාන යටතේ 2014 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන අධිකාරියට ලැබී තිබුණු රු.23,000,000 ක මුදලින්, එම වර්ෂයේ වියදම් දැරීමෙන් පසුව ඉතිරිවූ රු.17,116,595 ක මුදල පළාත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති අවිච්ඡේද නොකර 2015 වර්ෂය තුළ එකතුව රු.2,058,350 ක වියදම් දරා තිබුණු අතර, ඉතිරි රු.15,058,245 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය තුළ රඳවාගෙන තිබුණි.

6.12 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සම්පත්

-------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් පාසල්වලට අනුයුක්ත කර තිබුණු ගුරුවරුන් 6 දෙනෙකු වෙනත් සේවාවල සේවයේ නියුතුව සිටින නමුත්, අදාළ පාසලේ වැටුප් ලේඛනයෙන් වැටුප් ලබාගෙන තිබුණි. 2015 වර්ෂයේදී ඔවුන් හයදෙනා වෙනුවෙන් රු.2,421,518 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ii) වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට වෙනත් ආයතනවල සේවයට අනුයුක්ත කර තිබුණු ගුරුභවතුන් හතරදෙනෙකු වෙනුවෙන් ගෙවා තිබුණු රු.7,054,297 ක වැටුප් හා දීමනා ඔවුන් අනුයුක්ත කර ඇති ආයතනවලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) මාතර කලාපයේ කණිෂ්ඨ විදුහලක ගුරුවරියක් 2009 ජුලි 26 දින සිට මාස තුනක (03) කාලයක් සඳහා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට තාවකාලිකව අනුයුක්ත කර තිබුණු අතර, 2015 ජනවාරි 01 දින නැවත සේවයට වාර්තා කර තිබුණි. ඒ අනුව කාලය දීර්ඝ කිරීමකින් තොරව අදාළ ගුරුවරිය වර්ෂ පහකුත් මාස පහක කාලයක් අදාළ පාසලට කිසිඳු සේවයක් ලබානොදී රු.1,774,112 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ලබාගෙන තිබුණි.

(ආ) රුහුණු සංචාරක කාර්යාංශයේ 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,425,660 ක් වූ කොග්ගල ප්‍රදේශයේ පිහිටි ඉඩමක අයිතිය අධිකාරිය සතු බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ රු.36,826,881 ක වියදමින් මෙම ඉඩමේ හෝටල් පාසැලක් ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිලිවල ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය විසින් හෝටල් පාසැලක් පවත්වා ගෙන යන නමුත්, කාර්යාංශයට ඉන් කිසිඳු ආදායමක් ලැබී නොතිබුණි. කෙසේ වුවද, දරන ලද පිරිවැය මත 2008 වර්ෂයේ සිට සියයට 5 බැගින් මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂිකව ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඇ) බෙන්තොට රෙස්ට්ටුරන්ට් ආයතනය පිහිටි ඉඩමේ අයිතිය රුහුණු සංචාරක කාර්යාංශයට පවරා නොගෙන 2007 සහ 2008 යන වර්ෂවලදී කාර්යාංශය විසින් එකී ඉඩමේ පිහිටි ගොඩනැගිලි නවීකරණ කටයුතු වෙනුවෙන් රු.2,511,299 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. කෙසේ වුවද, දරන ලද වියදම වෙනුවෙන් කාර්යාංශයට කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු නමුත්, දරා තිබුණු වියදම මත 2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂිකව සියයට 5 බැගින් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

## 6.13 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.13.1 ගුරුවරු අනුයුක්ත කිරීම, අතිරික්ත හා ඌනතා

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් අධ්‍යාපන සේවයට අදාළ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 250 | 176 | 99 | 25 |
| තෘතියික මට්ටම | 1542 | 917 | 625 | - |
| ද්විතියික මට්ටම | 22610 | 23478 | 69 | 937 |
| ප්‍රාථමික මට්ටම | 1892 | 1744 | 153 | 05 |
| වෙනත්(අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්) | - | 39 | - | 39 |
| එකතුව | 26294 | 26354 | 946 | 1006 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක නිලධාරීන් 99 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 04 ක නිලධාරීන් 625 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 02 ක නිලධාරීන් 69 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක නිලධාරීන් 153 ක් ද වශයෙන් එකතුව 946 ක් වූ පුරප්පාඩු සංඛ්‍යාවක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක නිලධාරීන් 25 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 02 ක නිලධාරීන් 937 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක නිලධාරීන් 05 ක්ද, වශයෙන් අතිරික්තව සේවයේ යොදවා ගෙන තිබුණු නිලධාරීන් 1006 සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(iii) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත නොවූ තනතුරු සඳහා 39 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා තිබුණු නමුත්, ඔවුන්ගේ තනතුරු විධිමත්කර ගැනීමට සමාලොචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) දකුණු පළාත් අධ්‍යාපන සේවාවට අයත් විදුහල්පති හා ගුරු කාර්ය මණ්ඩල තුලනය නොකිරීම හේතුවෙන් පළාත තුළ වූ පළාත් සභා පාසල් 1050 හි ගුරුවරුන්ගේ අතිරික්තයක් සහ විදුහල්පතිවරුන්ගේ ඌණතාවයක් පවතින බව නිරීක්ෂණය විය. ඒ පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| කලාපය | විදුහල්පති අතිරික්තතා හා ඌණතා | | | ගුරු අතිරික්තතා හා ඌණතා | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත ගණන | සිටින ගණන | අතිරික්තය/ (ඌණතාවය) | අනුමත ගණන | සිටින ගණන | අතිරික්තය/ (ඌණතාවය) |
| ගාල්ල | 205 | 168 | (37) | 2841 | 2967 | 126 |
| අම්බලන්ගොඩ | 124 | 66 | (58) | 1649 | 1486 | (163) |
| ඇල්පිටිය | 173 | 99 | (74) | 2114 | 2043 | (71) |
| උඩුගම | 100 | 55 | (45) | 1241 | 1290 | 49 |
| මාතර | 165 | 133 | (32) | 2078 | 2472 | 394 |
| අකුරැස්ස | 107 | 58 | (49) | 1432 | 1469 | 37 |
| මුලටියන | 116 | 73 | (43) | 1531 | 1955 | 424 |
| මොරවක | 111 | 46 | (65) | 1333 | 1496 | 163 |
| හම්බන්තොට | 159 | 82 | (77) | 2272 | 2406 | 134 |
| තංගල්ල | 140 | 43 | (97) | 1786 | 1936 | 150 |
| වලස්මුල්ල | 125 | 81 | (44) | 1687 | 1956 | 269 |
| | 1,525 | 904 | (621) | 19,964 | 21,476 | 1,512 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) කලාප 11 තුළම විදුහල්පතිවරුන්ගේ ඌනතාවයක් පැවති අතර, සමස්ථ ඌනතාවය 621 ක් විය.

(ii) කලාප 9 ක ගුරුවරුන් 1746 ක අතිරික්තයන් පැවතියදී, ඉතිරි කලාප 2 හි ගුරුවරුන් 234 ක ඌනතාවයක් පැවතුණි.

(iii) මුලටියන , මාතර හා වලස්මුල්ල යන කලාපයන් තුළ කැපී පෙනෙන ගුරු අතිරික්තයන් පවතින බව නිරීක්ෂණය විය.

(iv) උඩුගම අධ්‍යාපන කලාපයට අයත් පාසල් 35 ක විදුහල්පති තනතුරු සඳහා ගුරු සේවයේ නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. ශ්‍රේණිධාරි විදුහල්පතිවරු අනුයුක්ත පාසල් 44 න් පාසල් 03 ක අනුමත ශ්‍රේණියට වඩා ඉහළ ශ්‍රේණිවල විදුහල්පතිවරුද, පාසල් 04 ක අනුමත ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණිවල විදුහල්පතිවරුද සේවයේ යොදවා ඇති බැවින් නිසි සැලසුමකට අනුව විදුහල්පතිවරු අනුයුක්ත කර නොමැති බව නිරීක්ෂණය විය.

(v) 2015 වර්ෂය තුළ මොරවක කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටි පාසල් 78 කින් පාසල් 33 ක විදුහල්පති තනතුරු පුරප්පාඩුවී තිබුණි.

(vi) සේවක කළමනාකරණය නිසි පරිදි ඉටු නොවීම තුළ මාතර අධ්‍යාපන කලාපය තුළ පිහිටි පාසල් 22 ක විදුහල්පති තනතුර, වැඩ බලන විදුහල්පතිවරුන්ගෙන් ආවරණයවී තිබූ අතර, අදාළ තනතුරුවල නිසි පරිදි පිහිටුවා නොතිබීම නිසා ශ්‍රී ලංකා විදුහල්පති සේවයට උසස්වීම් ලබා ඇති ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් 45 දෙනෙකු නියෝජ්‍ය හා සහකාර විදුහල්පති තනතුරුවල සේවය කරන බව නිරීක්ෂණය විය.

(ඇ) ඇල්පිටිය හා ගාල්ල යන අධ්‍යාපන කලාප වෙත 2015 හා ඊට පෙර වර්ෂවලදී ස්ථාන මාරුවීම් ලබා පැමිණි පිළිවෙලින් ගුරුවරුන් 07 දෙනෙකුගේ හා ගුරුවරුන් 30 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එම නිලධාරීන්ගේ පත්වීම්, ස්ථාන මාරුවීම්, අධ්‍යාපන සුදුසුකම්වල හා වැටුප් ගෙවීම්වල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

6.13.2 දකුණු පළාත් සෞඛ්‍ය සේවාව

---------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1069 | 803 | 266 | - |
| තෘතියික මට්ටම | 240 | 158 | 82 | - |
| ද්විතියික මට්ටම | 4681 | 3871 | 824 | 14 |
| ප්‍රාථමික මට්ටම | 3068 | 2591 | 484 | 07 |
| එකතුව | 9058 | 7423 | 1656 | 21 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක 266 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු 22 ක 82 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 29 ක 824 ක් ද , ප්‍රාථමික මට්ටමේ තනතුරු 18 ක 484 ක්ද, වශයෙන් පැවති පුරප්පාඩු 1656 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද්විතීයික මට්ටමේ තනතුරක 14 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක් ද , වශයෙන් සේවකයින් 21 දෙනෙකුගේ අතිරික්තයක් පැවති නමුත්, එම අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත කරන ලද සංවර්ධන සහකාර නිලධාරිනියක්ද, රියදුරන් දෙදෙනෙකුද, කාර්යාල කාර්ය සහායකයෙකු හා සෞඛ්‍ය කාර්ය සහායකයින් 07 දෙනෙකු ඇතුළු 11 දෙනෙකු වෙනත් ආයතනවල සේවය සඳහා මුදාහැර, මුදාහළ දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.8,961,494 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ට ගෙවා තිබුණි.

(ඈ) (i) 2011 ජුනි 01 දින සෞඛ්‍ය කාර්ය සහායක පත්වීමක් ලැබූ අයෙකු එම වසරේ දෙසැම්බර් 01 සිට 2014 ජනවාරි 12 දක්වා දකුණු පළාත් සභා නියෝජ්‍ය සභාපතිගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර තිබුණි. 2014 ජනවාරි 12 දින දකුණු පළාත් සභාව විසුරුවා හැරීමෙන් අනතුරුව ඔහුගේ සේවා ස්ථානය පිළිබඳව කිසිඳු විමසීමක් හෝ තොරතුරක් නොමැතිව තිබියදී, එදින සිට 2016 පෙබරවාරි දක්වා කාලය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.746,811 ක් ඔහුට ගෙවා තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 01 දින සිට 2016 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ නිල ඇඳුම් දීමනා ලෙස රු.42,712 ක මුදලක්ද, ඔහුට ගෙවා තිබුණි.

## 7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 විගණන හා කළමනාකරණ කමිටු

2000 ජුනි 12 දිනැති අංක IAI/2000/1 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2007 ජනවාරි 26 දිනැති අංක 5/2007 දරන දකුණු පළාත් සභා (මුදල්) චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට එක් රැස්වීමක් බැගින් වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, ආයතන 20 ක් විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | ආයතන සංඛ්‍යාව | පවත්වා තිබුණු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 2015 | 07 | රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි |
| - එම - | 03 | " 1 බැගින් පවත්වා තිබුණි |
| - එම - | 05 | " 2 බැගින් පවත්වා තිබුණි |
| - එම - | 05 | " 3 බැගින් පවත්වා තිබුණි |

7.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශයක් , දෙපාර්තමේන්තු 02 ක්, කාර්යාල 02 ක්, කොමිෂන් සභාවක් හා අධිකාරී 4 ක් ඇතුලුව ආයතන 10 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

7.3 පිළිතුරු නොළත් විගණන විමසුම්

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 අගෝස්තු 31 දින වන විට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම්වලින් විමසුම් 16 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. මෙකී විගණන විමසුම්වලට භාජනය වු ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.159,875,637 ක් විය.

(ආ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.56,678,016 ක් වූ නැවත ගෙවිය යුතු රඳවා ගැනීම් වලින් කල් ඉකුත්වූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමේ අවශ්‍යතාවය ඉකුත් විගණකාධිපති වාර්තාවලින් සහ පළාත් ගිණුම්කාරක සභා තීරණ මගින් පෙන්වා දී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී ද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

8. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී හඳුනාගන්නා ලද අඩුපාඩු විගණන විමසුම් මඟින් වරින් වර ප්‍රධාන ලේකම් කාර්යාලයේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ii) හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අසාමාන්‍ය කාල ප්‍රමාදයන් පැවතුණි.

(iii) ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද පදනම ගිණුම් ප්‍රතිපත්ති යටතේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිරව් කර නොතිබුණි.

(iv) භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමේ කාලප්‍රමාදයන් පැවතුණි.

(v) කල්බදු පදනම මත ලබාගත් වාහනවල වටිනාකම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ආදායම් රැස්කිරීම.

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) නිසි අධ්‍යයනයකින් සහ ඇගැයීමකින් යුතුව ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ii) ඇස්තමේන්තුගත ආදායම් ඉලක්ක සම්පූර්ණ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(iii) ආදායම් ඇස්තමේන්තු පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර අදාළ සංශෝධනයන් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ඇතැම් ආදායම් විෂයයන් වල ඇස්තමේන්තුගත ආදායම් සීමාවන් ඉක්මවා තථ්‍ය ආදායම් පැවතුණි.

(v) හිඟ ආදායම් අයකර ගැනීම දිගින් දිගටම ප්‍රමාද වෙමින් පැවතුණි.

(ඇ) වියදම් ඇස්තමේන්තු සහ ප්‍රතිපාදන උපයෝජනය

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ශීර්ෂ 10 ක් යටතේ වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.12,262,000 ක් වූ මුලු ශුද්ධ ප්‍රතිපාදනයන්ම ඉතිරි වී තිබුණි.

(ii) ශීර්ෂ 21 කට අයත් වැය විෂයයන් 127 ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තත්‍ය වියදම් අතර, සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයන්ගෙන් ඉතිරිවීම් පැවතුණි.

(iii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වූ වැය විෂයයක රු.9,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, ශීර්ෂ 3 කට අයත් වැය විෂයයන් 07 ක සියයට 40 සිට සියයට 93 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

(iv) රේඛීය අමාත්‍යාංශ මගින් එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 68 ක ඉතිරිවීම් පැවතුණි.

(ඇ) ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීම

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ණයගැති හා ණයහිමි ශේෂ වෙනුවෙන් ශේෂ සනාථ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීම දිගින් දිගටම ප්‍රමාද වෙමින් පැවතුණි.

(ඉ) ගිණුම්කරණය

---------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණ නමුත්, ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් ගිණුම්ගත කිරීමේදී උපචිත පදනම අනුගමනය කර නොතිබුණි.

(ii) පොදු තැන්පත් ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(iii) තැන්පතු ගිණුම් ශේෂ සහ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් ශේෂ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ගිණුම් හා පළාත් භාණ්ඩාගාර ගිණුම් අතර නොසැසඳීම් දක්නට ලැබුණි.

(iv) පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම් වල සීමා ඉක්මවීම් හා අවම ලැබීම් සීමා සඳහා ළඟා නොවීම් පැවතුණි.

(v) ස්ථාවර වත්කම් , හිඟ ආදායම් සහ බැරකම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.